# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

# ලංසු ආරාධනයයි

## සනීපාරක්ෂක සහ පිරිසිදු කිරීමේ සේවා සැපයීම 2024/2025

01. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් 2024/2025 වසර සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සනීපාරක්ෂක සහ පිරිසිදු කිරීමේ සේවා ලබා ගැනීම පිණිස සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

    වැඩිදුර විස්තර ලංසු ලේඛනවල සඳහන් වේ. ලංසු, **රු.100,000/-** ක ලංසු සුරක්ෂණයක් සහිතව ඉදිරිපත් කළ යුතුය.

02. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු පටිපාටිය යටතේ සිදුකෙරේ.

03. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, කොළඹ 08. ඇල්විටිගල මාවත, අංක 276 පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයට සහ හන්තාන (මහනුවර), කදිරාන (මීගමුව) පිහිටි සංඛ්‍යාත අධීක්ෂණ මධ්‍යස්ථාන සහ කොකාවිල් හි පිහිටි රූපවාහිනී/විකාශන සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයට වසරක කාලයක් සඳහා සනීපාරක්ෂක සහ පිරිසිදු කිරීමේ සේවා ලබාගැනීමට අපේක්ෂා කරයි.

04. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, අධ්‍යක්ෂ (පාලන සහ ආයතනික කටයුතු), පාලන අංශය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 ලිපිනයෙන් හෝ **011-2673486** ඔස්සේ වැඩිදුර තොරතුරු ලබාගත හැකිය. **2024.08.22** සිට **2024.09.10** දක්වා වැඩ කරන දිනවල **පෙ.ව. 9.00** සිට **ප.ව. 2.00** අතර කාලයේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන අංශයෙන් ලංසු ලේඛන පරීක්ෂා කළ හැකිය.

05. උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට **2024.08.22** සිට **2024.09.10** දින දක්වා ප.ව. 03.00ට පෙර, ව්‍යාපාර ලිපි ශීර්ෂයක පාලන අංශය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලිඛිත අයදුම්පතක් යොමු කිරීමෙන් සහ නැවත ගෙවනු නොලබන **රු.3,000/-** ක ගාස්තුවක් ගෙවීමෙන් (මුදලින් ගෙවීම් කළ යුතුය) ලංසු ලේඛන ලබාගත හැකිය.

06. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සනීපාරක්ෂක සහ පිරිසිදු කිරීමේ සේවා සැපයීම 2024/2025"** යනුවෙන් සඳහන් කළ, මුද්‍රා තබන ලද ලංසු **2024.09.11 ප.ව. 2.00** ට පෙර පාලන අංශය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 වෙත ලැබෙනු පිණිස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය, එසේ නැතහොත් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතුය. ලංසු භාරගෙන අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. සියලුම ලංසු පිළිබඳ අවසන් තීරණය ගැනීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු වේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,**
**276, ඇල්විටිගල මාවත,**
**කොළඹ 08.**

SELACINE MEDIA SOLUTIONS